සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

11 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය :....................................... බුද්ධ ධර්මය - I කාලයඃ පැය 01යි.

වැදගත් :

⁕ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.

⁕ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

⁕ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(1) සීලයෙහි පිහිටා කටයුතු කළ තැනැත්තාට මරණය බියකරු අත්දැකීමක් නොවේ. තමා සුගතියකම උපදන බව හෙතෙම හොඳින් දනියි. මෙම අදහස සනාථ කිරීම සඳහා බුදුන් වැඩ සිටි කාලයේ එන කතා පුවතකි.

1. පූතිගත්තතිස්ස තෙරුන්ගේ කතා පුවත.
2. චුන්ද නම් හූරුවැද්දා පිළිබඳ කතා පුවත.
3. ධම්මික නම් උපාසකතුමා පිළිබඳ කතාව.
4. කාලි යකින්නගේ කතා පුවත.

(2) බොරු කියන තැනැත්තා,

1. ජීවිතය කවර මොහොතේ අහිමි වේ දැයි බියෙන් ජීවත් වේ.
2. අන් අයගේ සන්නිවේදන අයිතිය කඩ කරයි.
3. නීතිය ඉදිරියේ දඬ ගෙවීමට සිදු වේ.
4. කායික මානසික සෞඛ්‍යයෙන් පිරි හේ.

(3) යම් ක්‍රියාවකට නුවණැති අය නින්දා කරත් නම් එබඳු කුඩා වූ වරදකින් පවා වැළකීමට උත්සහ කළ යුතු යැයි දැක්වෙන අදහස ඇත්තේ,

1. සිඟාලෝවාද සූත්‍රයෙහි ය.
2. රතන සූත්‍රයෙහි ය.
3. මංගල සූත්‍රයෙහි ය.
4. කරණීය මෙත්ත සූත්‍රයෙහි ය.

(4) සියලු සුවඳ වර්ග අභිභවා පැතිරෙන සුවඳ බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව,

1. විලවුන් වල සුවඳ ය.
2. මල් වල සුවඳ ය.
3. සිල් සුවඳ ය.
4. ගුණ සුවඳ ය.

(5) සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන ආකාරයට භෝග විනාශයට හේතුවන කරුණු හයට (6) අයත් නොවන පිළිතුර තෝරන්න.

1. පාරිසරික සංචරණය.
2. පවිටු මිතුරු ඇසුර.
3. අලසකමින් කල් ගෙවීම.
4. නුසුදුසු වේලාවන්හි මංමාවත්වල හැසිරීම.

(6) බුදුරජාණන් වහන්සේ අප විසින් කළ යුතු දේ ද, නොකළ යුතු දේ ද උගන්වන ලදි. මෙහි දී අප විසින් නොකළ යුතු දේ හැඳින්වෙන වචනය වන්නේ,

1. සිරිත් නමිනි.
2. විරමණය නමිනි.
3. භාවනාව නමිනි.
4. චාරිත්‍ර නමිනි.

(7) "අප්පමත්ත" යන පදයේ තේරුමට නොගැළපෙන අර්ථය තෝරන්න.

1. අප්‍රමාදව කටයුතු කිරීම.
2. ප්‍රමාද නොවීම.
3. ජීවිතය ආපස්සට ගෙන යන ක්‍රියාවලින් වැළකීම.
4. ජීවිතයේ අභිවෘද්ධියට දියුණුවට හානිකර දේ කිරීම.

(8) දමනය වීම, සංයත බව, හික්මීම, ශීලයෙන් කය වචනය හික්මවීම එම ගුණ ධර්මයන්හි පිහිටා කටයුතු කිරීම හඳුන්වන පාලි වචනය වන්නේ,

1. සඤ්ඤත 2. සුචිකම්ම 3. නිස්සම්මකාරි 4. සතිමතෝ

(9) සිල්වත් සමාගම පිහිටුවා උපසම්පදාව යළි ආරම්භ කළ බුදු සසුනේ චිර පැවැත්ම සඳහා විශාල සේවයක් කළ ශ්‍රේෂ්ඨ සංඝ පීතෘවරයාණෝ,

1. වීදාගම මහා මෛත්‍රීය මා හිමියෝ ය.
2. අග්ග මහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රීය මා හිමියෝ ය.
3. අසරණ සරණ වැලිවිට සරණංකර සංඝරාජයාණන් වහන්සේ ය.
4. අග්ග මහා පණ්ඩිත රේරුකාණේ චන්දවිමල නා හිමියෝ ය.

(10) කොත් කැරැල්ල හුණුදඬුවලින් සාදා සුදු රෙදිවලින් ආවරණය කොට චෛත්‍යයේ වැඩ අවසන් වූ ලෙසට මරණ මංචකයේ හුන් දුටුගැමුණු රජතුමාට පෙන් වූයේ,

1. සද්ධාතිස්ස රජතුමා විසිනි.
2. වලගම්බා රජතුමා විසිනි.
3. මහසෙන් රජතුමා විසිනි.
4. මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි.

(11) දේවානම්පියතිස්ස රජු විසින් මිහිඳු මහ රහතන් වහන්සේට පිදූ අසිරිමත් උද්‍යානය සහිත විහාරය වන්නේ,

1. අනුරාධපුර ඉසුරුමුණි විහාරය ය.
2. අනුරාධපුර ජේතවනාරාමය ය.
3. අනුරාධපුර අභයගිරි විහාරය ය.
4. අනුරාධපුර මහා විහාරය ය.

(12) දිවයින පුරා දුටුගැමුණු රජු විසින් ඉදිකළ වෙහෙර විහාර සංඛ්‍යාවෙන්,

1. අසූවකි. 2. හැට අටකි. 3. හතලිස් හයකි. 4. පනස් නවයකි.

(13) පිය - පුතු ගැටුමෙහි ප්‍රතිඵලයක් ලෙස ගැමුණු කුමරු කාලයක් පියාගෙන් ඈත්ව වාසය සඳහා තෝරා ගත් ස්ථානය වන්නේ,

1. විජිතපුරය ප්‍රදේශයේ ය.
2. කන්තලය ප්‍රදේශයේ ය.
3. කොත්මලේ ප්‍රදේශයේ ය.
4. රුහුණු මාගම්පුර ප්‍රදේශයෙ ය.

(14) එළාර රජුට පෙර මෙරට බලය අල්ලා ගෙන සිටි ආක්‍රමණිකයන් දෙදෙනා වන්නේ,

1. සේන - ගුත්තික ය.
2. චෝරනාග - සිව ය.
3. පණයමාර - පිළයමාර ය.
4. වටුක - නීලිය ය.

(15) වැලිවිට ශ්‍රී සරණංකර හිමිපාණෝ උපසම්පදාලාභී භික්ෂූන් වහන්සේලා වැඩම කරවා ගත් රට ලෙස සැලකෙන්නේ,

1. බුරුමයෙන් ය.
2. ජපානයෙන් ය.
3. තායිලන්තයෙන් ය.
4. ඉන්දියාවෙන් ය.

(16) වයස අවුරුදු 16 දී මහනුවර සූරියගොඩ විහාරයේ වැලිවිට සරණංකර නමින් පැවිදි බිමට පත් පින්වත් කුල කුමරුවාගේ ගිහි නාමය,

1. විජේතුංග බණ්ඩාර ය.
2. සූරියගොඩ බණ්ඩාර ය.
3. කුලතුංග බණ්ඩාර ය.
4. රන්දුණු බණ්ඩාර ය.

(17) ''මහිච්ඡතාවය'' යනුවෙන් ධර්මයේ සඳහන් වන්නේ,

1. සසර කෙළවර ය.
2. අසීමිත ආශාව ය.
3. ලදදෙයින් සැනසීම ය.
4. නොසන්සුන් සිත ය.

(18) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු,

1. තිදොර ය.
2. ත්‍රිවේදය ය.
3. ත්‍රිවිද්‍යා ය.
4. ත්‍රිලක්ෂණ ය.

(19) රූප ස්කන්ධය, යන්න සඳහා ධර්මානුකූල අර්ථ දැක්වීම තෝරන්න.

1. සිත තුළ උපදින සටහන් නමිනි.
2. සැප - දුක් මැදිහත් විඳීම්.
3. ශරීරය, කය, භෞතික සැකැස්ම.
4. අරමුණු දැන ගැනීම විජානනය.

(20) සතර මහාභූතයන්ට අදාළ ,තේජෝ, යනු,

1. ද්‍රව ගතිය ය.
2. තද ගතිය ය.
3. සෙලවෙන ගතිය ය.
4. උෂ්ණ - සීතල ගතිය ය.

(21) සිල්වත් වීම යනු,

1. උත්සහයෙන් හා කැපවීමෙන් ක්‍රියා කිරීම ය.
2. විනිවිද දකින නුවණ ය.
3. කය - වචනය දෙකෙහි සංවර බව ය.
4. දහමෙහි ඇලී ගෙවන දිවිය ය.

(22) සමථ භාවනාවෙන් ලද හැකි ඉහළම තත්ත්වය කුමක් ද?

1. කිං කුසලගවේසීව ජීවත් වීමයි.
2. සත්ත සමාපත්තිය ලබා ගැනීම යි.
3. පඤ්ච අභිඥා අෂ්ට සමාපත්තිය ලබා ගැනීම යි.
4. අහසින් යාමේ හැකියාව ලබා ගැනීම යි.

(23) සමථ භාවනාව වැඩීමේ දී ලබා ගත යුතු කර්මස්ථාන සංඛ්‍යාව,

1. හතලිහකි.
2. හතලිස් හතකි.
3. හැටකි.
4. හැට හතරකි.

(24) සිත කිළිටි කරන, කුසල් සිත් වලට බාධා කරන්නේ,

1. මෝඩකම් ය.
2. නීවරණයන් ය.
3. තිලක්ෂණයන් ය.
4. කර්මයන්.

25) නිදිබර බව, උදාසීනකම හැඳින්වෙන්නේ,

1. විචිකිච්ඡාව ලෙස ය.
2. උද්ධච්ච කුක්කුච්ච ලෙස ය.
3. ව්‍යාපාදය ලෙස ය.
4. ථීනමිද්ධය ලෙස ය.

(26) කුසල මූල යනු,

1. අලෝභ, අදෝස, අමෝහ ය.
2. ලෝභ, දෝස, මෝහ ය.
3. ඡන්ද, චිත්ත, විරිය ය.
4. පඨවි, ආපෝ, තේජෝ ය.

(27) තෙරුවන්හි ඇති ගුණ ගණනින්,

1. තිස් දෙකක් ය.
2. අසූවක් ය.
3. විසි හතරක් ය.
4. හැට හතරක් ය.

(28) ''රහසක් පවු නොකොට'' මෙම කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

1. සුභාෂිතය නම් ග්‍රන්ථයේ ය .
2. ලෝකෝපකාරය නම් ග්‍රන්ථයේ ය.
3. ලෝවැඩ සඟරාව නම් ග්‍රන්ථයේ ය.
4. බුදුගුණ අලංකාරය ග්‍රන්ථයේ ය.

(29) බෞද්ධයෙකු වීමේ මුල් පියවර නම්,

1. බුදුන් සරණ යෑම ය.
2. දහම් සරණ යෑම ය.
3. තෙරුවන් සරණ යෑම ය.
4. සඟුන් සරණ යෑම ය.

(30) භික්ෂූන් වහන්සේ සමාජයට බරක් නොවන සේ ජීවත් විය යුතු බව බුදු රඳුන් දේශනා කළහ. ඒ සඳහා යොදා ගත් උපමාව වන්නේ,

1. බඹරා මල නොතලා රොන් ගන්නා සේ යන්නයි.
2. මලින් මලට යන සමනලයන්සේ යන්නයි.
3. නෙළුම් කොළේ ජලය නොරැඳෙන්නාක් මෙන් යන්නය.
4. හැට පිරුණත් වඳුරන් බිම නොයනවා යන්නය.

(31) ගැබිනි මාතාවන්ට විශේෂ කොට දේශනා කරවා ගනු ලබන පිරිත වන්නේ,

1. රතන සූත්‍ර දේශනාව ය.
2. අංගුලිමාල සූත්‍ර දේශනාව ය.
3. කරණීය මෙත්ත සූත්‍ර දේශනාව ය.
4. මහා මංගල සූත්‍ර දේශනාව ය.

(32) ''අරඹවු, නික්මෙව්, යෙදෙව්, බුදු සසුන්හි දිනව් මරසෙන් පරදා බට කැළයට වැදි ඇතෙකු සේ'' යනු,

1. ගිරිමානන්ද සූත්‍රයේ එන අදහසකි.
2. සිගාලෝවාද සූත්‍රයේ එන අදහසකි.
3. ඉසිගිලි සූත්‍රයේ එන අදහසකි.
4. අරුණාවතී සූත්‍රයේ එන අදහසකි.

(33) අභිනිෂ්ක්‍රමණය කළ බෝසතාණන් කී වසරක් දුෂ්කර ක්‍රියා කළේ ද?

1. සත් වසකි.
2. සය වසකි.
3. සිව් වසකි.
4. පස් වසකි.

(34) ''මෙවන් පුතෙකු, මෙවන් සැමියෙකු, මෙවන් පියෙකු ලද්දෝ නිවුණෝ වෙති'' යි නිබ්බුත පද කියූ ශාක්‍ය කුමරියගේ නම,

1. යසෝදරා ය.
2. විශාකා ය.
3. කිසාගෝතමී ය.
4. උත්පලවන්නා ය.

(35) සිදුහත් බෝසතාණන් වහන්සේ ,රාහුලයෙක් උපන්නේ ය බන්ධනයක් හට ගත්තේ, යැයි පැවසුවේ,

1. අලුත උපන් කුමරා දැක ගැනීමේ අදිටනි නි.
2. දුකින් මිදීමේ මඟ සොයා යෑමේ තිර අදිටනි නි.
3. තම ගමන ගැන දුකෙන් කල්පනා කරමි නි.
4. කෝකත් හොදට සිදුවන්නේ යැයි සිතූ නිසා ය.

(36) සුදොවුන් රජුගේ එකම සිහිනය වූයේ තම පුතු,

1. ශ්‍රේෂ්ඨ උගතෙක් වනවා දැකීමට ය.
2. දඹදිව එක්සේසත් කරනවා දැකීමට ය.
3. බුදු බව ලබන්නට හැකි වෙනවා දැකීමට ය.
4. සක්විති රජෙකු වනවා දැකීමට ය.

(37) යසෝදරා දේවියට භාවිතා කළ තවත් නමක් වන්නේ,

1. භද්දකච්චායනා කුමරිය.
2. කුණ්ඩලකේසි කුමරිය.
3. භද්‍රා කුමරිය.
4. ඛේමා කුමරිය.

(38) ''යෝ චේ වස්සතං ජීවේ
''දුස්සීලෝ අසමාහිතෝ'' යන ගාථාව ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

1. උජ්ණ සීතල ගතියයි.
2. ධම්ම පදයේ ය.
3. සුත්ත නිපාතයේ ය.
4. විමාන වත්ථුවේ ය.

(39) මාගේ මේ ව්‍යායාමය බුද්ධ සාසනයේ චිරස්ථිතිය සඳහා මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ යැයි අභීත හඬ නැගූ නරපතියා,

1. මහසෙන් රජු ය.
2. මහා පරාක්‍රමබාහු රජු ය.
3. වලගම්බා රජු ය.
4. දුටුගැමුණු රජු ය.

(40) භික්ෂූන් වහන්සේලා අධි ශීලයෙහි පිහිටනවා යනුවෙන් අදහස් කරනු ලබන්නේ,

1. උපසපන් වීම ය.
2. දස සීලය සමාදන් වීම ය.
3. විනය කර්මවලට සහභාගී වීම ය.
4. සාමණේර සීලය සමාදන් වීම ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

11 | S | II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය :....................................... බුද්ධ ධර්මය - II කාලය: පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) සිදුහත් කුමරු ස්වයංවරයකින් තෝරාගත් කුමරිය හැඳින්වීම සඳහා භාවිත කරන නම් දෙකක් ලියන්න.

(ii) බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

(iii) ''රහසත් පව් නොකොට - කෙලෙසරයනුත් දුරු කොට'' යන කවිය සම්පූර්ණ කරන්න..

(iv) සිදුහත් බෝසතාණෝ ''කිං කුසලගවේසීව'' සිටි කාලයේ දී හමු වුණු සප්ත හා අෂ්ට සමාපත්ති ලාභී තවුසන් නම් කරන්න.

(v) වයස අවුරුදු 16 යේ දී වැලිවිට සරණංකර හිමියන් පැවිදි වූ විහාරය නම් කරන්න.

(vi) ''භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪති ඒතායතානි භාවනා'' මෙම පාඨයේ අර්ථය ලියන්න.

(vii) තම අභිමතය පරිදි සාරමසක් මුළුල්ලේ භාවනා කොට, ප්‍රතිඵල නොලැබූ සැරියුත් හිමියන්ගේ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේගේ නම ලියන්න.

(viii) සිගාලෝවාද සූත්‍රයේ දක්වෙන, භෝග විනාශයට හේතුවන කරුණු අතරින් දෙකක් නම් කරන්න.

(ix) දුටුගැමුණු මහ රජු ඉදි කළ මහා සෑයට පමණක් දෙවන වන ගොඩනැගිල්ල කුමක් ද?

(x) පංචනීවරණ ධර්ම අතරින් දෙකක් නම් කරන්න.

(2) (i) සිදුහත් බෝසතුන්ගේ ශිෂ්‍ය ජීවිතයේ සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) මහා අභිනිෂ්ක්‍රමණය සඳහා සිදුහත් කුමරුගේ සිත යොමු කළ පෙරනිමිති සතර නම් කරන්න.

(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා බෝසත් සිරිත චරිතායනය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(3) (i) ''උට්ඨානවතෝ සතිමතෝ'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගැනීමට මෙම ගාථාව කෙතෙක් දුරට අදාළ වේ දැයි විමසන්න.

(4) (i) සීලයේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(ii) බුදුරජාණන් වහන්සේ දේශනා කළ සීලයෙහි ආනිසංස තුනක් නම් කරන්න.

(iii) ''සීලය පුද්ගලයකුගේ ලෞකික හා ලෝකෝත්තර ජීවිතය සැපවත් කරයි'' මේ පිළිබඳ ව අදහස් දක්වන්න.

(5) (i) ශීලයෙන් යුතුව සමාධි භාවනාව සඳහා යොමු වීමේදී පුද්ගලයා සතු විය යුතු ගුණාංග දෙකක් නම් කරන්න.

(ii) දෛනික ජීවිතයට සමථ භාවනාවෙන් ලද හැකි ප්‍රයෝජන 3 ක් ලියන්න.

(iii) ''විපරිත මනස අසහනය උපදවයි., මිනිසා නොමගට යොමු කරයි. ඒ මනස සන්සුන් කිරීමට භාවනාව උපකාරී වේ.'' පැහැදිලි කරන්න.

(6) (i) භික්ෂූන් වහන්සේ වෙතින් සිදුවන ආගමික සේවාවන් 2 ක් නම් කරන්න.

(ii) ඉහත දක් වූ එක් කරුණක් පැහැදිලි කරන්න.

(iii) බුදු සසුනේ පැවැත්මට සංඝරත්නයේ රැකගැනීමෙන් සිදුවන යහපත විස්තර කරන්න.

(7) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට සරණංකර මා හිමි

(ii) බුදුරජාණන් වහන්සේගේ අරහං ගුණය

(iii) විදර්ශනා භාවනාව

(iv) ත්‍රිලක්ෂණය

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

11 | S | I,II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 4 | 21 | 3 | 31 | 2 |
| 2 | 2 | 12 | 2 | 22 | 3 | 32 | 4 |
| 3 | 4 | 13 | 3 | 23 | 1 | 33 | 2 |
| 4 | 3 | 14 | 1 | 24 | 2 | 34 | 3 |
| 5 | 1 | 15 | 3 | 25 | 4 | 35 | 2 |
| 6 | 2 | 16 | 3 | 26 | 1 | 36 | 4 |
| 7 | 4 | 17 | 2 | 27 | 3 | 37 | 1 |
| 8 | 1 | 18 | 4 | 28 | 4 | 38 | 2 |
| 9 | 3 | 19 | 3 | 29 | 3 | 39 | 4 |
| 10 | 1 | 20 | 4 | 30 | 1 | 40 | 1 |

## II පත්‍රය

(1) (i) යශෝධරා / භද්දකච්ඡායනා / බිම්බා දේවිය / රාහුල මාතා

(ii) සමථ / චිත්ත / සමාධි / භාවනා

විදර්ශනා / විපස්සනා / ප්‍රඥා / ත්‍රිලක්ෂණ / තිලකුණු භාවනාව

(iii) රහසක් පව් නොකොට - කෙලෙසරයනුත් දුරු කොට

නිසි වූයෙන් පුදට - අරහ යන නම කියති මුනිඳුට

(iv) සප්ත සමාපත්ති - ආලාර කාලාම

අෂ්ට සමාපත්ති - උද්දකරාමපුත්ත

(v) මහනුවර සූරියගොඩ විහාරය

(vi) කුසල් දම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි.

(vii) ස්වර්ණකාර හිමි

(viii)
* මදයට හා ප්‍රමාදයට හේතුවන මධ්‍යසාර ගැනීම
* නොසුදුසු වේලාවන්හි මං මාවත්වල සැරිසැරීම
* නැටුම්, ගැයුම්, වැයුම්හි ලොල් බව
* සූදුවෙහි යෙදීම
* පවිටු මිතුරන් ඇසුර
* අලසකමින් කල් ගෙවීම

(ix) ලෝවාමහාපාය / ලෝවාමහා ප්‍රාසාදය

(x) කාමච්ඡන්ද, ව්‍යාපාදය, ථිනමිද්ධ, උද්දච්ච කුකුච්ච, විචිකිච්ඡා

(2) (i) * වැදගත් තීරණ ගැනීමේදී සිතා විමසා බලා කටයුතු කිරීම.
* ගුරුවරයා උගන්වන සියලු ශිල්ප ශාස්ත්‍ර මැනවින් කඩිනමින් ප්‍රගුණ කිරීම
* කීකරු බව
* කාරුණික බව
* උගන්වන දේ හොඳින් ධාරණය කර ගැනීම
* මෙත් සිතුවිලිවලින් යුතු වීම.
* නිර්භීත බව

(ii) මහල්ලෙක් / ලෙඩෙක් / මළමිනියක් / පැවිදි රුවක්

(iii) ශිෂ්‍ය ජීවිතයක් සාර්ථක කර ගැනීම සඳහා අභියෝග ජය ගැනීම අවශ්‍ය ගුණයකි. ශිෂ්‍ය ජීවිතයක් ගත කළ සිදුහත් බෝ සතුන්ට ශිල්ප හැදෑරීම, සතර පෙරනිමිති දැකීම, නිබ්බුත පද ඇසීම, පස්කම් සුව අත්හැරීම, පියරජුගේ අපේක්ෂාවන් ඉටු කිරීම ආදී විවිධ අභියෝගයන්ට මුහුණදීමට සිදුවිය. උපතේදී මවගේ වියෝව සිදුවුවත් ශිල්ප හැදෑරීම සඳහා එය භාධාවක් කර නොගනී. එම අභියෝග ජය ගැනීමට අධිෂ්ඨානයෙන් හා කැපවීමෙන් නිවැරදි මාවතක ගමන් කිරීමට එතුමාණෝ සමත් වූහ. එය ශිෂ්‍යයින්ට ආදර්ශයකි. (පළමු පාඩමේ පිටු අංක 02 ට අනුව සමස්ථය සළකා ලකුණු ලබා දෙන්න.) (ලකුණු $2+3+5=10$)

(3) (i) උට්ඨානවතො සතිමතො
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජිවිනෝ
අප්පමත්තස්ස යසෝභිවඩ්ඪති

(ii) උත්සාහයෙන් ද, නිවැරදි සිහියෙන් ද යුතු නිදොස් දේ විමසා බලා කරන තැන්පත් දැහැමි දිවි පැවතුම් ඇති නොපමා වූ පුද්ගලයාගේ කීර්තිය මනාව වැඩේ.

(iii) ශිෂ්‍ය ජීවිතයේ සාර්ථකත්වය සඳහා මෙම ගාථාවේ සඳහන් කරුණු 7 යොදාගත හැකි ආකාරය පෙන්වා දිය යුතුයි. උත්සාහවන්ත බව, එළඹ සිටි සිහිය, පිරිසිදුව කටයුතු කිරීම, ඤුවණින් පිරික්සා සිතා විමසා කටයුතු කිරීම, හික්මීම, දැහැමිව ජීවත් වීම, අප්‍රමාදී බව, (10 ශ්‍රේණිය පිටු අංක 43 ට අනුව සමස්ථය සළකා ලකුණු ලබා දෙන්න. (ලකුණු $2+3+5=10$)

(4) (i) සිරිත් (සාමාදානය) / විරිත් (විරමණය)

(ii) * මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම
* කීර්තිය පැතිරීම
* ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකි වීම
* සිහි මුළා නොවී කළුරිය කිරීම
* මරණින් මතු සුගතියෙහි උපත ලැබීම

(iii) සිල් රැකීමේ ආනිසංසයක් ලෙස මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීමට හැකි බව බුදුරදුන් පෙන්වා දී තිබේ. සිල්වල් පුද්ගලයා එළඹ සිටි සිහියෙන් කටයුතු කරමින් භෝග විනාශයට හේතුවන කරුණු 06කින් ඉවත් වේ. ඔහු දුසිරිතෙන් වැළකී සුසිරිතෙහි යෙදෙන බැවින් ධනය වර්ධනය වේ. දිළිඳුකමද දුරු වෙයි. පංච දුෂ්චරිතයෙන් වැළකී සදාචාර සම්පන්න වීම ලෞකික දියුණුවට හේතු වේ.

සීලයෙහි ආනිසංසයක් ලෙස මරණින් මතු සුගතියෙහි උපත ලැබීමට හැකි බව පෙන්වා දී තිබේ. සීලය වනාහි සමාධිය කරාත් සමාධිය ප්‍රඥාව කරාත් ප්‍රඥාව ඤාණය හා විමුක්තිය කරාත් පුද්ගයා මෙහෙයවන හෙයින් එය ලෝකෝත්තර දියුණුවට හේතු වේ. (පිළිතුර සමස්ථයක් ලෙස සළකා ලකුණු ලබා දෙන්න) (ලකුණු $2+3+5=10$)

(5) (i) ඉන්ද්‍රිය සංවරය / සති සම්පජඤ්ඤය / සන්තුට්ඨිතා

(ii) * ලෝභ, ද්වේශ, මෝහ ආදී කෙළෙස් සිතුවිලි පාලනය වේ.
* ධාරණ ශක්තිය වැඩි වේ.
* පොත පත පාඩම් කිරීමේදී වෙනදාට වඩා පහසුවක් දැනේ
* සිතෙහි තෘප්තිමත් ස්වභාවයක් ඇති වේ.
* අසහනය නැති වී ප්‍රසන්න පෙනුමක් ඇති වේ.
* කායික රෝග පීඩා අඩුවීමෙන් නිරෝගී වේ.
* සිත විසිරී යාමට නොදී එකග කර ගැනීමට උපකාරී වේ.

(iii) මිනිස් මනස විපරිත කරන්නා වූ අසංවර කරන්නා වූ කරුණු පංච නීවරණ ලෙස හඳුන්වයි. මනස විපරිත වූ කල්හි සිතෙහි අසහනය හට ගනී. වැරදි සංකල්පනාවට යොමු සිත මිනිසා නොමගට යොමු කරයි. හරි වැරැද්ද තෝරා ගැනීමට එය පුද්ගලයාට බාධාවකි.

සිතෙහි ස්වභාවය හා සිත කිළිටි කරන නීවරණයන්ගේ ස්වභාවය හඳුනාගත් තැනැත්තා සිත යහපතෙහි යොදවයි. පාපාකාරී සිතුවිලි ප්‍රහාණය කොට කුසල් සිතුවිලි වර්ධනය කරයි ඒ සඳහා උපකාරී වන්නේ භාවනාවයි. භාවනාව වූ කල්හි කුසල් දහම් වැඩි දියුණු කිරීමේ මානසික අභ්‍යාසයකි. (10 ශ්‍රේණියේ 04 පාඩම ඇසුරින් පිළිතුරු සකස් විය යුතු ය.) (ලකුණු $2 + 3 + 5 = 10$)

(6) (i) * ගිහියා පවින් වලක්වා කුසලයෙහි යෙදවීම.
* පිංකම් පිළිබඳ චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීම.
* අවමංගල්‍ය අවස්ථාවල ආගමික වතාවත් ඉටු කිරීම
* ධර්මාවබෝධයට සාරගර්භ අනුශාසනා, ධර්ම දේශනා පැවැත්වීම.
* පුද්ගලයාගේ අධ්‍යාත්මික සංවර්ධනයට මග පෙන්වීම.

(ii) 10 ශ්‍රේණිය 02 වන පාඩම ඇසුරින් පිළිතුරු සකස්වී තිබිය යතුය.

(iii) බුදු සසුනේ පැවැත්ම සඳහා බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය ම පැවතිය යුතු අතර ඉන් එක් රත්නයක් හෝ නැති වී යාම තුළින් ශාසනය අභාවයට යයි. බුදුරදුන් දේශිත සද්ධර්මය ආරක්ෂා කරන්නේ සංඝරත්නයයි. සසුනට විපත් සිදුවන අවස්ථාවල ගිහි පැවිදි දෙපාර්ශ්වයම දැනුවත් කර සසුන රැක බලා ගැනීමට කටයුතු කරන මුරදේවතාවුන් හෙයින් සංඝ රත්නය රැක ගැනීම බුදු සසුනේ චිරස්තිථියට හේතු වේ. (පිළිතුරු සමස්ථයක් ලෙස සළකා ලකුණු ලබා දෙන්න) (ලකුණු $2 + 3 + 5 = 10$)

(7) (i) ***වැලිවිට සරණංකර හිමි***

1698 ජුනි 18 දින තුම්පනේ වැලිවිට ගමේ කුළතුංග බණ්ඩාර නමින් උපත ලබා වයස අවුරුදු 16 දී පැවිදි බිමට පත් විය. බොහෝ දුෂ්කරතා මැද සිංහල, පාලි, සංස්කෘත කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳ ඉගෙනිම ලැබීය. එකල උපසම්පදාව පවා අහිමි විය. පිරිහී ගිය භික්ෂු සමාජය දුරලා යළි උපසම්පදාව ඇති කොට ශාසනය ආරක්ෂා කර ගැනීමට උන්වහන්සේ මුල් විය. මේ නිසා කීර්ති ශ්‍රී රාජසිංහ රජු සංඝරාජ පදවියෙන් පුදනු ලැබීය. ''උඩගු නොව මහණ'' යන නිහතමානී බවින් ක්‍රියා කළ උන්වහන්සේ මුනිගුණ අලංකාරය, සාරාර්ත සංග්‍රහය, රත්නත්‍රය ප්‍රණාම ගාථා සන්නය, සතර බණවර සන්නය ආදී පොත් පත් ලියමින් ධර්ම ශාස්ත්‍රීය සේවාවක නිරත වී සිට 1778 ඇසළ පොහෝ දින අපවත් විය.

(ii) <u>*අරහං ගුණය*</u>

බුදුන් වහන්සේ රහසින්වත් පව් නොකළ හෙයින් ද, සියළු කෙළෙස් සතුරන් දුරු කළ හෙයින් ද, ලෝ වැස්සාගේ ආමිස පූජා, ප්‍රතිපත්ති පූජා ලැබීමට ඉතාමත් සුදුසු වූ හෙයින් ද සංසාර චක්‍රයාගේ අර සිඳලූ හෙයින් ද අරහං නම් වන සේක.

**(iii)** <u>*විදර්ශනා භාවනාව*</u>

යථාර්ථය හෙවත් ඇත්ත ඇති සැටියෙන් මනා නුවණින් විශේෂයෙන් දැකීම විදර්ශනා යන්නෙන් අදහස් වේ. ''විසේසේන පස්සතීති විපස්සනා'' විශේෂ වශයෙන් බලයි. දකියි. යන තේරුමෙන් විපස්සනා යයි කියනු ලැබේ. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යන පංච උපාදානස්කන්ධය අනිත්‍ය, දුක්ඛ, අන්ත්ම වශයෙන් බලන බැවින් ඒ ත්‍රිලක්ෂණ භාවනාව ලෙසද හඳුන්වයි.

(iv) <u>ත්‍රිලක්ෂණය</u>

සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව ත්‍රිලක්ෂණය ලෙස හඳුන්වයි. සම්බුදු කෙනෙකුන් ලොව පහළ වන්නේ අකුරු 8 කින් යුතු පද 3 ක් දේශනා කිරීමට ය. (අට්ඨක්ඛර තීනි පදා සම්බුද්ධේන ප්‍රකාශිතා)

(10 ශ්‍රේණියේ 5 වන පාඩම 31 වන පිටුවට අනුව සමස්ථය සළකා ලකුණු ලබා දෙන්න)

(ලකුණු $5 + 5 = 10$)

හෝ

ලෝකය හා සත්වයා පිළිබඳ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන පොදු ලක්ෂණ 3 ත්‍රිලක්ෂණයයි. අනිත්‍ය යනු වෙනස්වන ස්වභාවයයි. කැඩෙන බිඳෙන සුළු බවයි. සදා කල්හි නොපවත්නා බවයි. දුක්ඛ නම් දොම්නස් සහගත පීඩාකාරී අතෘප්තිකර ගතියයි. අනාත්ම නම් මමය. මාගේ ය. යනුවෙන් වෙනස් නොවන සදාකාලික ආත්මයන් වශයෙන් ගත හැකි යමක් නැති බවයි. (ලකුණු $2 + 3 + 5 = 10$)